# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2022 ජුනි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 ජුනි මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 10.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලිබල**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2022 ජුනි මස 15 වන දින]

එල්.ඩී.— ඕ. 8/2019

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**
**සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- — 2009 අංක 20 දරන පනතේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"විදුලි බලය සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගී වීම — 8. යම් තැනැත්තකුට විදුලි බලය උත්පාදනය කිරීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියකට සහභාගිවීමට හැකි ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) යම් තැනැත්තකු විදුලි බලය උත්පාදනය කිරීම පිණිස උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය."; සහ

(2) එහි (1අ) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(2) එහි (4) වන උපවගන්තියේ අතුරු විධානයේ-

(අ) "වැඩිදියුණු කරනු ලබන යම් අලුත් උත්පාදන පිරියතක් හෝ යම් පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීම සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "යම් අලුත් උත්පාදන පිරියතක් සම්බන්ධයෙන් හෝ වැඩිදියුණු කරනු ලබන හෝ වැඩිදියුණු කරනු ලැබිය යුතු යම් පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීම සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) (අ) ඡේදයේ "උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව;" යන වචන වෙනුවට "උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමට අනුකූලව; හෝ "යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.